# පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය
## சுற்றாடல் மற்றும் வனசீவராசிகள் வளங்கள் அமைச்சு
## Ministry of Environment and Wildlife Resources

"සොබාදම් පියස", අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சொபாதம் பியச", இல. 416/சி/1, ரொபர்ட் குணவர்தன மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Sobadam Piyasa", No. 416/C/1, Robert Gunawardana Mawatha, Battaramulla, Sri Lanka.
Gen. Tel. +94-11-2034100

ලේකම් / செயலாளர் / Secretary +94-11-2034121

ෆැක්ස් / தொலை நகல் / Fax +94-11-2879944


මගේ අංකය / எனது இல / My No: MMDE/07/EDU_TR/02/ WED/ 2020

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2020.05.27

**පරිසර චක්‍රලේඛ -: 03/2020**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම ප්‍රධාන ලේකම්වරුන්
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියළුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන - 2020 ජූනි 05**

සීඝ්‍ර ජනගහන වර්ධනයට සමගාමීව ඉස්මතු වු අසීමිත මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සීමිත සම්පත් අවිධිමත් ලෙස පරිහරණය කිරීම තුළින් පාරිසරික ගැටළු රැසක් උද්ගත වී ඇත. තවද, සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමේ හුදු අභිප්‍රායන් මත අවිධිමත් සංවර්ධන උපාය මාර්ග අනුගමනය කිරීම තුළින් හා මිනිස්'අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අසීමිත ලෙස සම්පත් පරිහරණය හේතුවෙන් සිදු වූ පාරිසරික අසමතුලිතතාවයන් මෙන්ම කාර්මික හා තාක්ෂණික විප්ලවයේ අනිටු ප්‍රතිවිපාක මෙම තත්ත්වයන් තවදුරටත් තීව්‍ර කිරීමට හේතු විය. මෙම අසමතුලිතතාවයන් මිනිසා ඇතුළු අනෙකුත් ජීවීන්ගේ පැවැත්මට විශාල තර්ජනයක් වී ඇති බැවින් පරිසර සංරක්ෂණයේ ඇති වැදගත්කම හා තිරසර සංවර්ධනය පිළිබඳව මේ වන විට කෝවිඩ් (COVID) - 19 වසංගතය ද සමඟ ලොව පුරා වෙසෙන ජනතාවගේ දැඩි අවධානය යොමු වී ඇත.

එබැවින්, පරිසර සංරක්ෂණය පිළිබඳව ලෝක ප්‍රජාවගේ අවධානය යොමු කිරීමේ අරමුණින් 1972 වර්ෂයේ පටන් **එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන** (UNEP) විසින් සෑම වසරකම **ජූනි 05 ජගත් පරිසර දිනය** ලෙස නම් කර එක් එක් වර්ෂයන්හිදී විශේෂිත තේමාවන් යටතේ එම දිනය සමරනු ලබයි. ඒ අනුව, ශ්‍රී ලංකාව ද මෙවර ජගත් පරිසර දිනය "**ජෛව විවිධත්වය" - සොබාදහමට ඉඩක්**" තේමාව යටතේ ලෝකයේ සෙසු රටවල් හා සමගාමීව ජෛව විවිධත්වයේ වටිනාකම ඉස්මතු කරමින් සැමරීමට කටයුතු කරමින් ඇත.

කෝවිඩ් (COVID) -19 වෛරසය මුළු ලොවම වෙලාගත් මොහොතක ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන් සමාජ දුරස්ථභාවය ආරක්ෂා කරමින්, මහජනතාව එක්රැස් නොකරමින් සිදුකළ යුතුව ඇති අතර මහජන සෞඛ්‍ය කොන්දේසිවලට අනුගතව සැමරුම් සිදු කිරීම මගින් වෙන කවරදාටත් වඩා ජගත් පරිසර දින සැමරුම අර්ථවත් කර ගත හැකිය.

ඒ අනුව, මෙවර ජගත් පරිසර දිනය හා පොසොන් පුර පසළොස්වක පොහොය දිනය එකම දිනයක යෙදීම තවත් සුවිශේෂී අවස්ථාවකි. ඒ සදහා පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය ඊට අනුබද්ධ ආයතනවල දායකත්වයෙන් දිවයිනේ සියළු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි තෝරාගත් සර්ව ආගමික සිද්ධස්ථානවල රුක් රෝපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. තව ද මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන ද මීට අමුණා ඇත.

ඊට සමගාමීව සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් ජෛවවිවිධත්වය හා පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබදව තම කාර්ය මණ්ඩලය දැනුවත් කර, ජගත් පරිසර දිනය සැමරීම සඳහා රටේ පවතින වාතාවරණයට ගැලපෙන පරිදි, තම ආයතනවලට සුදුසු විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින අතර ඒ සදහා රුක් රෝපණ වැඩසටහන්, ආයතන පරිශ්‍රය පවිත්‍රකිරීම ආදී කටයුතු සිදුකළහැකි බව ද කාරුණිකව දන්වමි.

ඒ අනුව ඔබ විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල තොරතුරු ෆැක්ස් අංක **0112879963** ෆැක්ස් මඟින් හෝ **pedudivision@gmail.com** විද්‍යුත් ලිපිනයට විද්‍යුත් තැපැල මඟින් හෝ මා වෙත වාර්තා කරන මෙන් ද කාරුණිකව ඉල්ලා සිටිමි.

පරිසර සංවේදී ප්‍රජාවක් බිහිකිරීම සඳහා ඔබ දක්වන සහයෝගය අතිශයින් අගය කරමි.

**ඒ එච් එස් විජේසිංහ**
ලේකම්

පිටපත්

01. ජනාධිපති ලේකම් - කා. දැ.ගැ.ස
02. අග්‍රාමාත්‍ය ලේකම් - කා. දැ.ගැ.ස.
03. අමාත්‍ය මණ්ඩල ලේකම් - කා. දැ.ගැ.ස.
04. අමාත්‍යාංශයට අයත් සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් - කා. දැ.ගැ.ස. හා අවශ්‍ය කටයුතු සඳහා